කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** WW/O/20/07/22/01
වර්ණය : ඇම්බර්

# තද වැසි, තද සුළං සහ මුහුදු රළු වීම පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2020 ජූලි මස 24 වන දින පෙ.ව 3.30 වන තෙක් වලංගු වන පරිදි
2020 ජූලි මස 23 වන දින ප.ව. 03.30 ට නිකුත් කරන ලදී.

## දිවයිනට දකුණු සහ නිරිත දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

**සැලකිලිමත් වන්න!**

**පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල පවතින ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය හේතුවෙන්, එම මුහුදු ප්‍රදේශවල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.**

**ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබදව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**




## අද ප.ව. 03.00 වනවිට තත්ත්වය

**දිවයිනට දකුණු සහ නිරිත දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ක්‍රියාකාරී වලාකුළු පද්ධතියක් වර්ධනයවී පවතී.**

## අනාවැකිය

**මෙම ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය ඉදිරි පැය 12 තුලදී තවදුරටත් සක්‍රියව පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.**